1 වෙනි පිටුවෙන්

Silly Season හෙවත් විලම්බිත සමය

බ්‍රිතාන්‍ය මහකොමසාරිස්වර යාට නියෝගකර ඇත.

මේ දිනවල එංගලන්තයේ තවත් රෝල්වෙන විලම්බිත සිද්ධියක් නම් ශ්‍රීලංකාවේ උසාවියෙන් නඩු විභාග කොට ත්‍රස්තවාදය මැඩලන පනත යටතේ චෝදනා ගණනකට වරදකරුවී, වසර විස්සකට සිර දඬුවම ලද මාධ්‍යකාරයා ගැන ඇති ආන්දෝලනයයි. මොකකින් හෝ මඩගැසීමට මාන බලන මෙහි කොටි සංවිධානද, ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් (Amnesty International) නම් කවදත් කොටින්ට පන්දම් ඇල්ලූ සංවිධානයද මේ දිනවල බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව ඉදිරියේ නිදිවරා මුරලෑමක් (vigil) ආරම්භ කර තිබේ. මේ අර ටික කලකට පෙර කළ පරණ සෙල්ලම් නැවත ඇරඹීමට කරන ප්‍රයත්නයකි. සිරදඬුවම් ලැබූ තිස්ස නාය ගම් නමැත්තාට අප රටේ භාවිතා වන රෝමානු ලන්දේසි නීතිය අනුව නීතිඥ යන් පෙනී සිටීමට සලස්වා, උසාවියේ නිසි පරිදි සාක්ෂි විභාගකොට දෙන ලද තීන්දු වකි. ඉහළ උසාවියකට අභියාචනා කිරීමේ නිදහස සියල්ලද ඔහුට ඇත. මේ සියළු දේ රජය ඉතා පැහැදිලිව පෙන්වා දී තිබුණි. නමුත් පරාජයෙන් වියරු වැටී සිටින මේ කොටි සංවිධාන දුවිඩයන්ටද, උන්ට කත් අදින මාධ්‍යකරුවන් ටද, ඇම්නෙස්ටිකාරයින්ටද ඒවායින් වැඩක් නැත. උඹලා මේ හදන්නේ තිස්ස නායගම් හිරේ සිටින වසර විස්ස පුරාම නිදිවරන්න හෝ නිදි වදින්නදැයි සිලි සීසන් බාසාවෙන් ම අපි ඔවුන්ගෙන් අසමු.

අප රටේ සිලිසිසන් හෙවත් විලම්බිත සමය

කොටි විනාශ කරලීමෙන් පසු අප ජයඝෝෂා පැවැත් වුවද කොටි ඩයස්පෝරාව විසින් බටහිර රාජ්‍ය මාධ්‍ය කාරයින් ප්‍රමුඛ කොටගෙන අරඹන ලද සටන්ද සාර්ථක ලෙස ව්‍යවර්ථ කරලීමට අප රටට හැකිවිණ. යුද සමයේ අවසාන වසර දෙක තුන තුළද එයට පසුවද අප රටේ ජනතාව රජය දේශපාලකයින්, මාධ්‍ය ආදීන් එකමුතුව පෙළගැසී මේ ජය අරභයා විනයකින් යුතුව කටයුතු කළෝය. එහෙත් පෙළුණු සතුරු පීඩාවලින් අස්වැසී යම් සැනසුමක් ලබත්ම අප රටේ ඒ ඉහත සඳහන් කළ කණ්ඩායම් වසර ගණනා වකට පෙර පැවති ආකාර යටම විලම්බිත වැඩ අරඹා ඇති බව පෙනේ.

යුද්ධය අවසන් උණුසුම පිටම පැවති ඌව ප්‍රාදේශීය සභා ඡන්දයෙන් රජය ඉම හත් ජයක් ලැබීය. මේ පිටම විලම්බිතයක් ඇරඹූයේ ද රජ යයි. එනම් දුරදිග නොබලා, නොසිතා උතුරේ නාගරික ඡන්දවලට බැසීම ය. මෙය කාගේ ලණුවක් කා කළ දෙයක්දැයි නොදනිමු. යුද ජය ගැන සිංහළ ජනයාගේ ආකල්ප, අවබෝධය, වසර විසි පහක් තිහක් පමණ දේශපාලන නිදහසක් තබා හරි ජීවිතයක්වත්

Silly Season Carnival parades in London's Notting Hill Gate

ත්‍රස්තවාදීන් යටතේ නොතිබුණු එහි එම දුවිඩ ජනතාවට තිබිය නොහැකිය. මේ වැරදි තක්සේරුවේ ප්‍රථිඵල දැන් අපි දනිමු. රජය බලා පොරොත්තු වූ ප්‍රතිචාරය උතුරු නැගණිරින් ලැබුණේ නැත.

වාසනාවකට මෙන් ඒ ඡන්ද පැවැත්වූ දිනවලම අළුත් එල්ටීටීඊ නායකයා ලෙස පත්වීම ලබා සිටි කේ. පී. නමැති ත්‍රස්තයා මැලේසියා, තායිලන්ත සහාය උඩ අප විශේෂ බුද්ධි අංශය කටයුතු කළ නිසා ග්‍රහණයට ගැන්මට හැකිවී අත්අඩංගුවට ගෙන ලංකාවට ගෙන ආවේය. ඡන්ද ප්‍රථිඵල වලින් රජය ලත් පරාජයෙන් ලංකා රජයට මඩ ගසන්නට ලැස්තිවී සිටි දෙමළ කොටි ඩයස්පෝරාව කේ. පී. අල්ලාගැන්ම නිසා අන්ද මන්ද විය. එයින් යන්තම් ඒ වරද මැකිණ.

ඒ සමගම කළ තවත් විලම්බිත වැඩක් නම් **13** වන සංශෝධනය ගෙන එන ප්‍රයත්නයයි. ඉන්දියාවේ බලපෑම් නිසා හෝ යල්පැන ගිය වාමාංශිකයින්ගේ අදහස් අනුව හෝ දුවිඩයින්ගේ සිත් දිනාගැන්මේ අරමුණෙන් හෝ ජනතාවට අරහං වූ මේ බහුබූත සංශෝධනය නැවත ඉදිරියට ආවේය. රටේ ඒකීය භාව යට අනතුරු හඟවන සංවේදී මාතෘකාවක් වූ මේ ගැන ඉහළම ඇමති මට්ටමෙන්ම ගැටීම් මතුවන ලකුණු දැකීම සමගම ජනාධිපති වරයාම ඒ සංවාද අස්වසා මහ ඡන්දයකින් පසුව පමණක් මේවා ගැන කටයුතු කළ හැකියයි කළ ප්‍රකාශයෙන් එය යට ගියේය.

තවත් විලම්බිත වැඩක් නම් ඉදිරියට ඇති දකුණු පළාත් සභා ඡන්දයට අපේක්ෂකයින් තේරීමේ තරඟයයි. සිනමා හා ටෙලි විෂන් නිළියන් වන අනර්කලී ආකර්ෂා සහ සුසන්තා චන්ද්‍රමාලී නම් දෙදෙන අපේක්ෂිකාවන් ලෙස පත් කිරීම පිළිබඳව බොහෝ කාලයක් මුළුල්ලේ පක්ෂය වෙනුවෙන් දරදිය ඇද, ඇප කැප වී වැඩකළ පළාතේ අය බොහෝ දෙනෙකුගේ දැඩි නොමනාපයට හේතුවී ඇත. එක් අතකට සුසන්තා චන්ද්‍රමාලීට සිය දකුණු පළාතේ ඉපදී හැදී වැඩීම නිසා කිසියම් සුදුසු කමක් යම් පමණකට තිබුණත් තනිකරම කොළඹ පළාතේ කෙනෙකු වෙමින් දකුණට කිසිදු සම්බන්ධකමක් නැති අනර්කලීට මාතර සංවිධායක කම හා ඡන්දයට තරඟකිරීමට සුදුසුකම් කෙසේ ලැබුණේදැයි පක්ෂයේ සාමාජිකයන්ම අප්‍රසාදය පළකරන බව දැන ගන්ට ඇත. එහෙත් රජය කියන්නේ නිළියක් තරඟයට දැමීමෙන් තරුණ ඡන්ද රජයට දිනාගත හැකි බවයි. එසේම එක්සත් ජාතික පක්ෂය රෝසි සේනානායක නම් නිළිය අපේක්ෂිකාවක් ලෙස මීට කලින් ඉදිරිපත් කර ඇති නිසා ඔවුන් අනර්කලී ඉදිරිපත් කළ බවයි. රජයේ ඉහළ අයගේ මෙවැනි සිලි හෙවත් අමන වැඩ නිසා ශ්‍රීලංකා නිදහස් පක්ෂය දියවී යා හැකියයි බොහෝ පාක්ෂිකයෝ දැන් කියති.

මෑතක ශ්‍රීලංකාව විමතියට පත් කළ තවත් විශේෂ දේවල් නම් ශ්‍රීලංකා පොලීසියේ පොලිස් අධිකාරිවරුන්ගේ මට්ටමේ නිළධාරීන්ද ප්‍රමුඛව කරනලද සිලි සීසන් වැඩය. එක් සිංහළ ඉහළ පොලිස් නිලධාරියෙක් කොටි සමග සම්බන්ධව ජනාධිපතිවරයා ඝාතනය කිරීම පිණිස උපාය යෙදූ හැටි හෙළිවී ඇත. අඟුලානේ තරුණයින් දෙදෙනෙකු සුළු චෝදනාවකට අත් අඩංගුවට ගෙන අඟුලානේ පොලිසියට ගෙනගොස් පොලීසියෙන්ම ඒ දෙදෙනා මරා දැමීමයි. තවත් අවස්ථාවක තරුණ ශිෂ්‍යයෙකු පැහැර ගෙන ගොස් පොලිස් අධිකාරිවර යෙකුගේ බිරිඳ හා පුතා ඒ සිසුවාට සිහිය නැතිවනතුරු පහරදී බර පතල ශාරීරික හානි සිදුකිරීමයි.

මේ පොලිස් අකටයුතුකම් ගැන විභාගකිරීම් හෝ දඬුවම් කිරීම් නැත. පොලීසියට අවශ්‍ය විදියට හිතුමතයේ හැසිරෙමින් පොලිස් කටයුතු මෙසේ වනවිට කාට කියන්නද? මුළු රටටම දැලි ගාවන මෙවැනි සිද්ධීන් ඇතිවන විට මේවා නීතිය හා විනය ගැන අප රටට දොස් නගන්නට බලා සිටින අප සතුරන්ට රුකුල් දීමක් නොවේද?

බොහෝ අවස්ථාවල රටේ සිදුවන අවශ්‍ය අනවශ්‍ය හැමදේට ම පාතේ දැන් ජනාධිපතිතුමාටම මැදිහත්වීමට සිදුවන සෙයක් උදා වී ඇති සැටියක් පෙනේ. ඒ ඒ අංශ සඳහා ඇමතිවරු සිය ගණනක් මුදල් කන්දරාවක් වියදම් කරමින් සිටියත් ඒ හාදයින් කරන්නේ මොන මළඉළව්වක්දැයි ජනතාව ඇසිය යුතු තත්වයක් මතුව ඇත.

මේ සිද්ධවෙන විලම්බිත රාශිය ගැන සිතන විට අප ගායිකාවක් අතීතයේ ගයා ඇති ජනප්‍රිය ගීතයක ඛණ්ඩයක් මතක්වේ. එනම්.....

" පුතා දන්නෙ නෑ හඳ ඇති කාලෙට වනන්තරේ හරි වැඩ කෙරෙනී....." හඳ ඇති කාලෙට හඳ මෝරාගෙන එන විට පිස්සන් ගේ පිස්සුව වැඩිවෙන බව අපි අසා ඇත්තෙමු. ඒ අර්ථයෙන්ද ඉහතකී ගීය වඩාත් ගැළපේ. මේ සිදුවන හා සිදුවන්නට නියමිත බොහෝ දේ පිස්සන්ගේ අමන විලම්බිත වැඩ බව හොඳ සිහි නුවණ ඇති අයට මනාව පෙනේ.

සමහර සිදුවීම් ගැන සිතන විට විලම්බිතකාරයින් අප රට දැනට වසර විස්සකට ඉහත තිබූ තත්වයට යළි ගෙන යන්නට හදනවාදැයි බිය මතුකරයි. ජනතාව ද විමසිලිමත්ව ඉදිරිපත්වී මේවා වැළැක්වූයේ නැති නම් මේ නොබෝ දා කොටි ත්‍රස්ත වාදය මැඩ පවත්වා අප ඇරඹූ ඉදිරි ගමන පෙර කියමන අනුව '**කිරි කළයක් දොවා ගොම බිඳුවක් මුසු කළා වැනිය**' යන්න වෙනස් කොට '**කිරි කළයක් දොවා ඊට ගොම ගොඩක්ම අත හැරියා වැනිය**'යි වෙනස් කිරීම හොඳ ය.

යුද්ධය ඉවරවී තවම ගතවූයේ මාස තුනක් පමණි. දැන් යළිත් දේශපාලකයින් ජනතාවට හිරිහැර-වන අන්දමින් හැසිරෙමින් ජනතාව ගෙන් ඈත්වන්නට යන බවක් පෙනේ. රටේ ජනතාවගේ විශ්වාසය බිඳගතහොත් කිසිම පාලකයෙකුට හෝ රජයකට පවතින්නට බැරිය.

වමේ ලේඛකයෙකුගේ අභාවය

දේශප්‍රේමී ලයනල් සරත් එදිරිසිංහ

පසුගිය දශක පහකටත් වැඩි කාලයක් තිස්සේ අප රටේ වාමාංශික ව්‍යාපාරයේ සහ දේශපාලන, ලේඛක, අධ්‍යාපන, සමාජීය ආදී විවිධ ක්ෂෙත්‍රයන්හි නියැලී සිටි ලයනල් සරත් එදිරිසිංහ මහතා 81 වසරක් ආයු විඳ මෙයට සති දෙකකට පෙර අභාවප්‍රාප්ත වූ බව කණගාටුවෙන් සඳහන් කර සිටිමු.

ලොවින් එකෙක් එක් දෙයකට වෙයි සමත යනුවෙන් පඬි වදනක් මෙන් එදා ඉදිරිපත් කළ බමුණු මතය බිඳ දමමින් ක්ෂෙත්‍ර රාශියක නියැලී ඒවා දක්ෂ අන්දමින් මෙහෙයවූ මේ දේශප්‍රේමී ලංකා පුත්‍රයා සිහිකරමින් අගැයුමක යෙදීම මෙම ලිපියේ අරමුණ වෙයි.

ගුරුවෘත්තිය අධ්‍යාපන සේවය ආදියෙහි දී ලයනල් එදිරිසිංහ යන නම භාවිතා කළ ද අනෙක් සමාජ කටයුතු වලදී කවුරුත් ඒ මහතා දැන සිටියේ ලේඛක නාමය වූ ලයනල් සරත් වශයෙනි. ලයනල් සරත්ම අඳුන්වාගත් ආකාරයට ඔහු ක්‍රියාකාරී වමේ දේශපාලක යෙකු විය. එවකට සිටි අපේ බොහෝ මාක්ස්වාදීන් මෙන් න්‍යායික මතභේදවල සිරවී සිටීමට වඩා තම මාක්ස්වාදී අවබෝධය අනුව ක්‍රියාකාරීවීම ඔහු අගය කළ බැවිනි. තරුණ පෙළටද එසේ මග පෙන්වී ය.

1928 මිරිහානේ උපන් ලයනල් සරත් මුලදී බොරලැස්ගමුවේ සිංහළ පාසැලේ උගත් අතර, පසු කලෙක ඉංග්‍රීසි අධ්‍යාපනය ලද්දේ කෝට්ටේ ක්‍රිස්තියානි කොලීජියේ (අද ජයවර්ධනපුර විදුහල) දීය. පසුව ආනන්ද විද්‍යාලයට සම්බන්ධව පැවති ඕල්කොට් විද්‍යාලයේ උගත් ඒ මහතා 1947 වනවිට ගුරු විභාගයෙන් සමත්වී ගුරු පත්වීමක් ලැබී ය.

එවකට කෝට්ටේ ආසනය වශයෙන් හැඳින් වුණු ප්‍රදේශය අද ඒ වටා ඇති ආසන රාශියක් වසා සිටි විශාල ප්‍රදේශයක් විය. එකල තිබුණු එකම වාමාංශික දේශපාලන පක්ෂය වූ සමසමාජ පක්ෂයට ලයනල් ගැටවර යාද ඇදී ගිය අතර 1945 වනවිට වයස 17 දී ඔහු එහි ක්‍රියාකාරී සාමාජිකයෙකු විය.

එදා රොබට් ගුණවර්ධන, පිලිප් ගුණවර්ධන, සෝමවීර චන්ද්‍රසිරි වැනි සම සමාජ නායකයින් සමග ආරම්භ කළ සිය ක්‍රියාකාරී දේශපාලනය විවිධ සටන්, ගැටුම්, ගැහැට විඳිමින් ජීවිතයේ අවසන දක්වාම නොපසුබටව ගෙන ගියේ ය. පසුව වමේ ව්‍යාපාරය භේදහින්නවී යාමත් සමග ලයනල් සරත් ලංකා කොමියුනිස්ට් පක්ෂයට සම්බන්ධ විය. ඔහුගේ මෙම තීරණයට හේතුවූයේ එම පක්ෂය දේශීය, ජාතික, සංස්කෘතිය හා මාක්ස්වාදය පදනම් කරගෙන කටයුතු මෙහෙයවූ නිසා බව බොහෝ විට කී ඔහු ඒ ස්ථාවරයේ දිගටම සිටියේ ය.

ලාබාල ගැටවරයෙකු වශයෙන් බෙලි අත්ත ප්‍රදේශයෙන් සිය ගුරු ජීවිතය ඇරඹූ ලයනල් එවකට දකුණේ වාමාංශිකයින් වූ ලක්ෂමන් රාජපක්ෂ, ජෝර්ජ් රාජපක්ෂ වැනි අය සමග එහි දේශපාලන අරගල මෙහෙය වීය. දේශපාලනමය හා වෘත්තීයමය හේතුන් උඩ නොයෙක් වර වැඩ තහනම්වලට ලක්විය. නමුත් ඔහු රටේ අධ්‍යාපන දියුණුව අරභයා දිගටම කටයුතු කළේය. පුවත්පත් ලේඛකයෙකු ලෙස සිය පෑන මෙහෙය වීය.

එදා සමාජ, අධ්‍යාපනික අවස්ථා වර-ප්‍රසාද ලත් ඉංග්‍රීසි උගත් පන්තියට සීමාවී තිබුණි. ස්වභාෂාවෙන් උගත් දුප්පත් පන්තියට හිමිවූයේ ස්වභාෂා ගුරුවරයෙකු, නොතාරිස් කෙනෙකු හෝ දේශීය වෛද්‍යවරයෙකු වීම පමණි. 1950 ස් ගණන්වලදී මේවා වෙනස්කර ලීමට ජාතික පොදු පෙරමුණක් මගින් ගුරු වරුන් පෙරටුව කළ කටයුතුවල මූලිකයෙකු ලෙස ලයනල් සරත් ක්‍රියාකාරී වීය.

මේවායේ ප්‍රථිඵල වශයෙන් 1956 දී ස්වභාෂාව රාජ්‍ය භාෂාව වීමෙන් පසු සමාජ තත්ව වෙනස්වීමට පටන්ගැනිණ. ඊළඟ අවශ්‍ය තාව වූයේ මුළු රටටම සාධාරණ වූ ජාතික අධ්‍යාපන ක්‍රමයක් ගොඩනැගීමය. ගුරුවරුන් ප්‍රමුඛ ප්‍රගතිශීලී අධ්‍යාපනික ව්‍යාපාර මේ සඳහා ක්‍රියාකාරී විය. 1960-64 සිරිමා බණ්ඩාරනායක මැතිනියගේ නායකත්වය යටතේ පොදු පෙරමුණ රජයෙන් ජාතික අධ්‍යාපනික පනතක් මගින් සාධාරණ ජාතික අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපිත කෙරිණ.

1965 -70 යුගයේ බලයට ආ ඩඩ්ලි සේනානායක මහතාගේ හත්හවුල් ආණ්ඩුවේ අධ්‍යාපන ඇමතිවූ ඊරියගොල්ල මහතා ගුරුවරුනට කළ පෙළීම් වලට එරෙහිව උද්ඝෝෂණකිරීම නිසා ලයනල් නැවත වැඩ තහනමට ලක්වූයේය. රැකියාව අහිමි වූ ඔහු දුර්මුඛවීම වෙනුවට තමන් ලද ඒ විරාමය දේශපාලන සටන් සඳහාත්, සිය අධ්‍යාපනයේ ඉදිරිගමන සඳහාත් යොදා ගත්තේ ය.

එම රජයට විරුද්ධව හාස්‍ය රසික ලෙස දේශපාලන පහරගැසීමට **බපිරි හටන** නමින් විනිඵ පුවත්පතක් ඔහු ඇරඹීය. ඉතා ඉක්ම නින් ජනප්‍රිය වූ බපිරි හටන මගින්ද පසුව බිහිවූ ඇත්ත පුවත්පත මගින්ද ලයනල් දිගටම සටනේ යෙදිණ. 1970 පැවැත්වුණ ඡන්දයේදී එම රජය පරදවා ප්‍රබල පොදු පෙරමුණු රජයක් බලයට ඒමට මේ පුවත්පත් ප්‍රබල සාධකයක් වීය. මේ කටයුතු කරන අතරම ලයනල් සරත් ඒ විරාමය තුළ විශ්වවිද්‍යාලයට ඇතුළත්ව ප්‍රථම උපාධියක්ද එයට පසු ඉතිහාස අංශයෙන් **M. A.** උපාධියක් ද ලැබී ය. මේවායින් ඔහු පෙන්නුම් කළේ දේශපාලනයෙහි නිරත වුවද කෙනෙකුට ඉගෙනුම් කාර්‍යයද සාර්ථක ලෙස ඉටු කළ හැකි බවයි. අද පරම්පරාවට මෙය හොඳ ආදර්ශයකි.

1970 නව රජය මගින් නැවත සේවයේ පිහිටවනු ලැබ, ලයනල් සරත් පළමුව වීරකැටිය මධ්‍ය මහා විද්‍යාලයේද, එයට පසු හැව්ලොක් ටවුමේ ලුම්බිණී මහා විද්‍යාලයේද විද්‍යාලාධිපති වශයෙන් විශාල සේවයක් කළේය. ඉන් අනතුරුව අධ්‍යාපන පරීක්ෂක වරයෙකු ලෙස ද විශ්‍රාම යනතුරු අධ්‍යාපන සේවයේ නිරතව සිටියේ ය.

විචාරවත් ලේඛකයෙකු ලෙස ඔහු සිය මුළු ජීවිතය තුළම ලේඛන කාර්‍යයෙහි නොකඩවා යෙදුණේ ය. සාහිත්‍යමය, ඓතිහාසික, දාර්ශනික, දේශපාලනමය අරගල සහ විචාර විමර්ශන ආදී විවිධ අංශ යටතේ ජනප්‍රිය පොත් තිස් ගණනක් ලියා පළකර ඇත.

විශ්‍රාම ගැන්මෙන් පසු ලයනල් සරත් දිගටම කම්කරු කටයුතුවල යෙදුණේය. වසර කීපයකට පෙර අප රටේ ප්‍රකාශ කළ කම්කරු ප්‍රඥප්තිය (workers charter) බ්‍රිතාන්‍යයේ ද ප්‍රචාරය කිරීම පිණිස ලන්ඩනයේ බ්‍රිතාන්‍ය වෘත්තීය සමුළුව (British Trade Union Congress) මගින් පවත්වන ලද සම්මන්ත්‍රණයට එහි ප්‍රධාන දේශනය කරන ලද්දේ ලයනල් සරත් විසිනි. මෙසේ විවිධ උපදේශක මට්ටමේ ඔහු අවසානය දක්වාම කටයුතු කළේ ය.

දයාබර සැමියෙකු සහ ආදරණීය පියෙකු වශයෙන් ලයනල් සරත් ඉතා සාර්ථක ආදර්ශ මත් ජීවිතයක් ගතකළේය. එදිරිසිංහ මහත්මිය විශ්‍රාම යනවිට නුගේගොඩ ශාන්ත ජෝන් බාලිකා විදුහලේ විද්‍යාලාධිපතිනිය විය. ඇය දැනට වසර කීපයකට පෙර මියගියාය. මේ පවුලට දරුවන් තිදෙනෙකි. වැඩිමහල් පුත් ප්‍රභාත් කොළඹ ව්‍යාපාරිකයෙකි. දියණිය අජන්තා නීතිඥවරියකි. ඇයගේ සැමියා වසන්ත තෙන්නකෝන්ද නීතිඥයෙකු වන අතර දෙදෙනම ලන්ඩනයේ නීතිඥවරු වෙති. බාල පුතා ද ලන්ඩනයේ රැකියාවක නිරතව සිටී. දරුවන් සාර්ථක ජීවිතවලට යොමුකිරීම ද ලයනල් සරත් ඉතා හොඳින් ඉටු කළේ ය.

මා බොහෝ කලක් ළඟින් ඇසුරු කළ ලයනල් සරත් එදිරිසිංහ මහතාට නිවන් සැප ලැබේවායි! පතමි.

♦ **වකුල ගුණපාල**
Ilford Essex UK